සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# යුරෝපා ඉතිහාසය

**12 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

උපදෙස් :- • නිවැරදි පිළිතුරට අදාළ අංකය තිත් ඉරි මත සඳහන් කරන්න. I කොටසට ප්‍රශ්න 40 ක් වේ.

## I කොටස

- අංක 01 සිට 15 දක්වා වූ එක් එක් ප්‍රශ්නයට නම් 05 ක් දී ඇත. ඒවා අතුරෙන් එකක් නොගැළපේ. නොගැළපෙන නම හඳුනාගෙන එහි අංකය වරහන් තුළ ලියන්න.

(01) (1) යුප්‍රටීස් (2) ක්‍රීට් (3) සයිප්‍රස් (4) සිසිලි (5) කෝර්සිකා (......)

(02) (1) බොස්පරස් (2) ජිබ්‍රෝල්ටා (3) මලක්කා (4) පැනමා (5) පෝක් (......)

(03) (1) විසිගොත්වරු (2) වැන්ඩල්වරු (3) යුදෙව්වරු (4) ඔස්ට්‍රොගොත්වරු (5) ලොම්බාර්ඩ්වරු (......)

(04) (1) පර්සියාව (2) ඇතැන්ස් (3) ස්පාටා (4) සමෝස් (5) මෙගාර (......)

(05) (1) ටයිබර් (2) හඩ්සන් (3) වොල්ගා (4) ඩැනියුබ් (5) රයින් (......)

(06) (1) ජින්ඩාර් (2) පයිතගරස් (3) ඇනක්සිමැන්ඩර් (4) තේලීස් (5) ඇනක්සිමීනීස් (......)

(07) (1) නිකලස් කොපර්නිකස් (2) විලියම් ශේක්ෂ්පියර් (3) ගැලීලියෝ ගැලීලි (4) අයිසැක් නිව්ටන් (5) ජොහැන්ස් කෙප්ලර් (......)

(08) (1) ජැමෙයිකා (2) මොරොක්කෝව (3) ඇල්ජීරියාව (4) ලිබියාව (5) කොංගෝව (......)

(09) (1) කොන්ස්ටන්ටයින් (2) ඔගස්ටස් (3) ජුලියස් සීසර් (4) ඇලෙක්සැන්ඩර් (5) ඩයක්ලීෂියන් (......)

(10) (1) ඇමරිගෝ වෙස්පුචි (2) බර්තලමියු ඩයස් (3) කබ්රාල් (4) ෆර්ඩිනන් ඉසබෙලා (5) වස්කෝ ද ගාමා (......)

(11) (1) ලියනාඩෝ ඩාවින්චි (2) මයිකල් ආංජිලෝ (3) බොට්ටි සෙල්ලි
(4) ෆැන්සිස් පෙට්රාක් (5) මකියාවෙලි (......)

(12) (1) ප්‍රවේණිය (2) ද්වන්ධ සටන් (3) නයිට්වරු
(4) ධනවාදය (5) ස්වයංපෝෂිත ආර්ථිකය (......)

(13) (1) ඔක්ස් ෆර්ඩ් (2) කේම්බ්‍රිජ් (3) අබෙලාර්ඩ්
(4) පැරිස් (5) බොලොඤ්ඤෝ (......)

(14) (1) ජිනෝවා (2) වෙනීසිය (3) ෆ්ලෝරන්ස්
(4) බුඩාපෙස්ට් (5) මිලාන් (......)

(15) (1) වින්ස්ටන් චර්චිල් (2) බෙනීටෝ මුසලෝනි (3) ජෝෂප් ස්ටාලින්
(4) ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (5) හැරී මෘමන් (......)

- **අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්නවලට පද යුගල බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. එම නොගැළපෙන යුගලය කුමක්දැයි තෝරා එහි අංකය ඉදිරියෙන් ලියන්න.**

(16)
(1) බර්තලමියු ඩයස් — සුභ පැත්මේ තුඩුව
(2) ක්‍රිස්ටෝපර් කොලම්බස් — බටහිර ඉන්දීය දූපත්
(3) නාවික හෙන්රි — නව ලෝකය සොයා ගැනීම
(4) වස්කෝ ද ගාමා — ඉන්දියාව
(5) ෆර්ඩිනන් මැගලන් — ලොව වටා යාත්‍රා කිරීම (......)

(17)
(1) ඩැනියුබ් — ගඟ
(2) සිසිලි — දූපත්
(3) කීල් — ඇළ
(4) සේන් — සමුද්‍ර සන්ධිය
(5) කැස්පියන් — මුහුද (......)

(18)
(1) මධ්‍ය ධරණී මුහුද සහ රතු මුහුද — සූවස් ඇළ
(2) කළු මුහුද හා කැස්පියන් මුහුද — ඩාඩලන්ස් සමුද්‍ර සන්ධිය
(3) එංගලන්තය හා ප්‍රංශය — ඉංග්‍රීසි ඕඩය
(4) උතුරු මුහුද සහ බෝල්ටික් මුහුද — කීල් ඇළ
(5) ස්පාඤ්ඤය හා මොරොක්කෝව — ජිබ්‍රෝල්ටා සමුද්‍ර සන්ධිය (......)

(19)
(1) ප්‍රංශ විප්ලවය — 1789
(2) උත්කෘෂ්ට විප්ලවය — 1688
(3) ඇමරිකන් නිදහස් සටන — 1776
(4) දෙවන ලෝක යුද්ධය — 1932
(5) ඉතාලිය එක්සත් කිරීම — 1848 (......)

The National e-learning Portal for the General Education

(20) (1) ගැලීලියෝ ගැලීලි දුරදක්නය
(2) විලියම් හාවේ රුධිර සංසරණය
(3) අයිසැක් නිව්ටන් ගුරුත්වාකර්ෂණය
(4) ඇල්බට් අයින්ස්ටයින් සාපේක්ෂතාවාදය
(5) කොපර්නිකස් වාෂ්ප එන්ජිම (......)

- **අංක 21 සිට 25 දක්වා වූ ප්‍රශ්න වලට මාතෘකාවට නොගැළපෙන කරුණ තෝරා ඊට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**

(21) පුනරුදය,
(1) ඉතාලියෙන් ආරම්භ විය.
(2) ආගමික ප්‍රතිසංස්කරණ වල ප්‍රතිඵලයක් ලෙස ඇරඹුණි.
(3) පුනරුදයේ දී මානව වාදය කැපී පෙනුනි.
(4) පුනරුද සමාජය ලෞකිකත්වයට නැඹුරු විය. (......)

(22) දේශ ගවේෂණය,
(1) ස්පාඤ්ඤ හා පෘතුගීසි ජාතීහු දේශ ගවේෂණයේ පුරෝගාමී වූහ.
(2) ෆර්ස්නන් ඉසබෙලා, වස්කෝ ද ගාමා ව මෙහෙය වූහ.
(3) 1498 දී කැලිකට් හි ගොඩ බැසීමට වස්කෝ ද ගාමා ට හැකි විය.
(4) පෙරදිග කරා නව මාර්ගයක් සෙවීමට දේශ ගවේෂණය ඇරඹීය. (......)

(23) මුල්කාලීන ක්‍රිස්තියානි ආගම,
(1) ක්‍රිස්තියානි ධර්මය ජේසුස් වහන්සේගේ ඉගැන්වීම මත පදනම් ය.
(2) මෙය ඒකදේවවාදී ආගමකි.
(3) තියඩෝසිස් අධිරාජයා ක්‍රිස්තියානි ආගම රාජ්‍ය ආගම කළේ ය.
(4) නීරෝ අධිරාජයා ක්‍රිස්තියානි ආගමට ආගමික නිදහස ලබා දුනි. (......)

(24) ආගමික ප්‍රතිසංස්කරණය ඇතිවීමට හේතු,
(1) කතෝලික පල්ලියේ දූෂණ.
(2) මාටින් ලූතර් ගේ නායකත්වය.
(3) කැල්වින් හා පාප්තුමා අතර තිබූ කිට්ටු සම්බන්ධය.
(4) පුණ්‍ය ඵල පත්‍රිකා විකිණීම. (......)

(25) එංගලන්තයේ කාර්මික විප්ලවයට තුඩු දුන් සාධක,
(1) අවශ්‍ය ප්‍රාග්ධනය තිබීම.
(2) ශක්තිමත් හමුදාවක් තිබීම.
(3) අවශ්‍ය ස්වාභාවික සම්පත් තිබීම.
(4) අවශ්‍ය වෙළඳපොළක් තිබීම. (......)

- **අංක 26 සිට 30 තෙක් වූ ප්‍රශ්නවල x සහ y තීරු දෙක අනුපිළිවෙලින් ගළපා ඇති සංයෝගයට අදාළ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

| | x | | y |
|---|---|---|---|
| (26) (i) | ක්ලිස්තීනිස් | A | වෛද්‍ය විද්‍යාවේ පියා |
| (ii) | හෙරඩෝටස් | B | ඇතිනියානු ප්‍රජාතන්ත්‍රවාදයේ පියා |
| (iii) | හිපොක්‍රටීස් | C | පළමුවන රෝම අධිරාජයා |
| (iv) | මක්ටේවියන් | D | මානවවාදයේ පියා |
| (v) | පෙට්රාක් | E | ඉතිහාසයේ පියා |

(1) BEACD (2) DEABC (3) AEDBC (4) DABCE (5) ABCDE (......)

| | x | | y |
|---|---|---|---|
| (27) (i) | ටොලමි | A | පරිණාමවාදය |
| (ii) | කොපර්නිකස් | B | සාපේක්ෂතාවාදය |
| (iii) | අයිසැක් නිව්ටන් | C | ගුරුත්වාකර්ෂණය |
| (iv) | චාල්ස් ඩාවින් | D | පෘථිවි කේන්ද්‍රවාදය |
| (v) | ඇල්බට් අයින්ස්ටයින් | E | සූර්ය කේන්ද්‍රවාදය |

(1) BCDAE (2) DECAB (3) CBEAD (4) ACDBE (5) EABCD (......)

| | x | | y |
|---|---|---|---|
| (28) (i) | නව ලෝකය | A | ඉතාලිය |
| (ii) | භූගෝලීය ප්‍රකාශයක් පමණි | B | ඇමරිකා එක්සත් ජනපදය |
| (iii) | හිරු නොබසින අධිරාජ්‍යය | C | බ්‍රිතාන්‍යය |
| (iv) | බ්‍රිතාන්‍ය කිරීටයේ මාණික්‍යය | D | තුර්කිය |
| (v) | යුරෝපයේ රෝගියා | E | ඉන්දියාව |

(1) BACDE (2) CABED (3) ABCDE (4) EDCBA (5) BCAED (......)

| | x | | y |
|---|---|---|---|
| (29) (i) | ප්ලේටෝ | A | ස්කැමරන් |
| (ii) | ටැයිටස් | B | යුටෝපියා |
| (iii) | බොකැෂියෝ | C | මුඝත්වයේ ඇගය වැනීම |
| (iv) | ඉරාස්මස් | D | ජනරජය |
| (v) | තෝමස් මූර් | E | ඉතිහාසය |

(1) BACDE (2) EDABC (3) DEACB (4) BAEDC (5) CDEAB (......)

| | x | | y |
|---|---|---|---|
| (30) (i) | රෝම අධිරාජ්‍යය | A | කොන්ස්තන්තිනෝපලය |
| (ii) | ග්‍රීක අධිරාජ්‍යය | B | රෝමය |
| (iii) | ඔටෝමන් අධිරාජ්‍යය | C | වියානා |
| (iv) | ඔස්ට්‍රියානු අධිරාජ්‍යය | D | ග්‍රීසිය |
| (v) | ජර්මන් අධිරාජ්‍යය | E | බර්ලීන් |

(1) DBACE (2) BDACE (3) ECBAD (4) DABCA (5) ABCED (......)

- **පහත දැක්වෙන එක් එක් ප්‍රශ්න අංකයට ප්‍රකාශන දෙක බැගින් සපයා ඇත.**

  - ප්‍රකාශන දෙකම නිවැරදි නම් අංක 1 ද,
  - ප්‍රකාශන දෙකම වැරදි නම් අංක 2 ද,
  - පළමු ප්‍රකාශනය පමණක් නිවැරදි නම් අංක 3 ද,
  - දෙවන ප්‍රකාශනය පමණක් නිවැරදි නම් අංක 4 ද යොදන්න.

(31) (1) පුරාණ ග්‍රීසිය කුඩා පෞර රාජ්‍ය වලින් සමන්විත විය.
(2) ක්‍රි.පූ. 5 වන සියවසේ දී ඇතැන්ස් හි ප්‍රජාතන්ත්‍රවාදය පැවතුණි. (......)

(32) (1) රෝමයේ බල ව්‍යාප්තිය රෝම සමූහාණ්ඩුව යටතේ සිදු විය.
(2) රෝම අධිරාජ්‍යය බටහිර හා නැගෙනහිර වශයෙන් බෙදුනේ නැත. (......)

(33) (1) නූතන රාජ්‍ය ක්‍රමයේ දී තමන්ට අභිමත විදේශ ප්‍රතිපත්තීන් රජයන් විසින් අනුගමනය කරයි.
(2) සියලුම රාජ්‍ය වලට නෛතික සමානාත්මතාවය හා ස්වාධීනත්වය හිමි වන්නේ නැත. (......)

(34) (1) වැඩවසම් ක්‍රමය තුළ වෙළඳාම ඉතා දියුණු තත්වයක පැවතුණි.
(2) රජුට තිබුණු අසීමිත බලය වැඩවසම් ක්‍රමයේ පරිහානියට මුල් විය. (......)

(35) (1) වෙස්ට්ෆේලියා ගිවිසුමෙන් තිස් අවුරුදු යුද්ධය ඇරඹුණි.
(2) ආගමික ප්‍රතිසංස්කරණ ඇතිවීමට පල්ලියේ දූෂණ හේතු විය. (......)

(36) (1) දෙවන ලෝක යුද්ධයේ දී හිරෝෂිමා නාගසාකි නගර විනාශ විය.
(2) එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවන්නේ දෙවන ලෝක යුද්ධයෙන් පසු ය. (......)

(37) (1) ඇමරිකාව ගවේෂණය කළේ ඇමරිගෝ වෙස්පුචි විසිනි.
(2) කොලොම්බස් විසින් බටහිර ඉන්දීය කොදෙව් දූපත් ලෙස ඉන්දියාව නම් කෙරිණි. (......)

(38) (1) පුනරුදය ඉතාලියෙන් ඇරඹුණි.
(2) කාර්මික විප්ලවය ද ඉතාලියෙන් ඇරඹුණි. (......)

(39) (1) කුරුස යුද්ධ වල ප්‍රතිඵලයක් ලෙස කොන්ස්තන්තිනෝපලය තුර්කි මුස්ලිම්වරුන්ට හිමිවිය.
(2) ඒ හේතුවෙන් යුරෝපා ජාතීන් පෙරදිගට ඒමට දේශ ගවේෂණය සිදුකිරීම සඳහා මාර්ග සෙවීමට පටන් ගත්හ.
(......)

(40) (1) XIV වන ලුවී රජුගේ කාලයේ ප්‍රංශ විප්ලවය ඇති විය.
(2) ''නිලධාරීයෝ නැත්නම් බදුත් නැත.'' මෙය ප්‍රංශ විප්ලවයේ ප්‍රකට පාඨයකි. (......)

(ලකුණු 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.**

(01) සපයා ඇති සිතියමේ පහත ස්ථාන සියල්ල ලකුණු කර කැමති 02 ක් පිළිබඳව ඓතිහාසික සටහන් ලියන්න.

(1) ලන්ඩන්

(2) කොන්ස්තන්තිනෝපලය

(3) ඉංග්‍රීසි ඕඩය

(4) බෝල්ටික් මුහුද

(5) සාඩිනියාව

(6) ඉතාලිය

(7) පැරිස්

(8) පෘතුගාලය

(නිවැරදිව ලකුණු කර ඇත්නම් ලකුණු 1 බැගින් ද, ඓතිහාසික සටහන්වලට ලකුණු 5 බැගින් ද දෙන්න.)

(02) පහත ක්ෂේත්‍ර ඇසුරින් පුරාණ ග්‍රීකයින්ගේ කාර්ය භාර්යය විමසන්න.

(i) ආගම

(ii) දේශපාලනය

(iii) අධ්‍යාපනය (ල.14)

(03) (i) වැඩවසම් ක්‍රම නැගී ඒමට තුඩු දුන් සාධක ලියන්න. (ල.06)

(ii) වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ පහදන්න. (ල.08)

(04) (i) ඉතාලියේ පුනරුදය ආරම්භ වීමට තුඩු දුන් සාධක ලියන්න.

(ii) පුනරුදයේ ප්‍රධාන කාර්ය සංසිද්ධීන් සාකච්ඡා කරන්න. (ල.14)

(05) රෝම අධිරාජ්‍යයේ බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා පහදන්න. (ල.14)

- අංක 01 ප්‍රශ්නය සඳහා අදාළ සිතියම.

## යුරෝපා සිතියම

